# ශ්‍රද්ධාව

මානසික සුවයක් කරා යන ආධ්‍යාත්මික ගමන් මගෙහි ශ්‍රද්ධාව හෙවත් 'තමන් අනුගමනය කරන ප්‍රතිපදාව හා එහි ශාස්තෘවරයා පිළිබඳ පවත්නා විශ්වාසය' ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ජීවිතයේ තමා සිදුකරන සියලු කටයුතුවලට වඩා මෙමඟින් උසස් සාර්ථක ප්‍රතිඵලයක් ලැබෙන බවටත් එය සෙසු සියල්ලට වඩා ඉක්මනින් මෙම ජීවිතයේ දී ම ආනිසංස ලද හැකි බවත් මෙහි දී විශ්වාසයක් පවතී. මෙම ශ්‍රද්ධාව පැවැති පමණට තමා අනුගමනය කරන ප්‍රතිපදාව පිළිබඳ සතුටින් එහි නිරත වන අතර තමා සිදු කරන සෙසු කාර්ය අතර මෙයට ප්‍රමුඛත්වයක් ලබා දී උද්‍යෝගයෙන් කටයුතු කරනු ඇත. කාම ඕඝ, භව ඕඝ, දිට්ඨි ඕඝ, අවිජ්ජා ඕඝ යන සතර ඕඝ තරණය කිරීමේ ක්‍රියාශීලී බලවේගය වන්නේ ශ්‍රද්ධාවයි. ශ්‍රද්ධාව ඇති පමණට දැඩි අභ්‍යන්තර අභිප්‍රේරණයක් ඇති වී ආධ්‍යාත්මික මගෙහි ඉදිරියට යාමට දැඩි උනන්දුවක් ජවයක් හටගනී.

ශ්‍රද්ධාව යන භාග්‍යවතුන් වහන්සේගේ අවබෝධයට පිළිබඳ පවත්නා විශ්වාසයයි. එනම් උන් වහන්සේ අවබෝධ කළ කර්මය, සසර, පටිච්චසමුප්පාදය, චතුරාර්ය සත්‍යය, ස්කන්ධ ධාතු ආයතන ආදී මූලික ඉගැන්වීම් සුවිශේෂී අනාවරණයන් පිළිබඳ අවබෝධයෙන් යුතුව හටගන්නා ප්‍රසාදයයි. එනම් කර්ම ප්‍රවෘත්තිය හා කර්ම නිවෘත්තිය පිළිබඳ බුදුරදුන්ගේ අවබෝධය විශ්වාස කිරීමයි. කෙටියෙන් ගත් කල කර්මය හා පටිච්චසමුප්පාදය පිළිබඳ අවබෝධයයි. බුදුරජාණන් වහන්සේ අවබෝධ කළ ධර්මය ලෝකයේ සැබෑ යථාර්ථය වන අතර එය වෙනත් කිසිවෙකුට ඒ ආකාරයෙන් අනාවරණය කර ගැනීමට නොහැකි වූ තත්ත්වයකි. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනය වූ ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙන් ලොවට අනාවරණය කළ පෙර නොඇසූ විසූ චතුරාර්ය සත්‍යය සංඛ්‍යාත දේශනය තුළ මෙම යථාර්ථය අන්තර්ගත වේ.

*පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි....*

යනුවෙන් දක්වෙන්නේ බුදුරජාණන් වහන්සේ එය ලොවට ප්‍රකාශ කළ ආකාරයයි.

*පටිසොතගාමිං නිපුණං දුද්දසං අණුං ...*

යනුවෙන් ප්‍රකාශ වන්නේ ද උඩුගං බලා යන පණ්ඩිත වේදනීය වූ අවබෝධ කරගැනීමට දුෂ්කර වූ සියුම් වූ එම යථාර්ථයේ ස්වභාවයයි.

මහාකම්මවිභංග සූත්‍රයේ 'මහාකම්මවිභංගෙ ඤාණය' යනුවෙන් ද මෙම සුවිශේෂී අනාවරණයන් විස්තර කොට තිබේ.

බුදුරජාණන් වහන්සේ දේශනා කළ අනුශාසනා අතර වඩාත් අවධාරණයෙන් ලොවට දේශනා කර ඇත්තේ දුකෙහි හටගැනීම හා නිරෝධය නම් වූ යථාර්ථයයි. එනම් අවිද්‍යාව ඇති විට දුක හටගන්නා ආකාරයත් අවිද්‍යාව නිරෝධය වන විට දුක නිරුද්ධ වන ආකාරයත් ය. එයින් දුක යන්න 'දුක' හා 'දුකට හේතුව' වශයෙන් ද දුක නිරුද්ධ වන ආකාරය 'දුක්ඛ නිරෝධය' හා 'දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදාව' වශයෙන් ද තවදුරටත් විග්‍රහ කළ හැකි ය. එනම්,

1. දුක්ඛ ආර්ය සත්‍යය
2. දුක්ඛ සමුදයාර්ය සත්‍යය
3. දුක්ඛ නිරෝධාර්ය සත්‍යය
4. දුක්ඛ නිරෝධගාමිනී පටිපදාර්ය සත්‍යය

යන චතුරාර්ය සත්‍ය විග්‍රහයයි.

මෙයින් මුල් අංග දෙක මිච්ඡා පටිපදාව වශයෙනුත් ඊළඟ අංග සම්මාපටිපදාව වශයෙනුත් ධර්මයෙහි විස්තර කොට තිබේ.

මිච්ඡා පටිපදව යනු අවිද්‍යාව ඇති විට සංඛාර, විඤ්ඤාණ ආදි පටිච්චසමුප්පාද අංග ගොඩනැගී ජරාමරණ කරා දුක විකාශනය වන ආකාරයයි. එනම් අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාරපච්චයා විඤ්ඤාණං.... ආදි වශයෙන් දැක්වෙන සසර පැවැත්මයි. සම්මාපටිපදව යනු අවිද්‍යාව නිරෝධයෙන් සංඛාර, විඤ්ඤාණාදිය නිරුද්ධ වී ජරාමරණවලින් සපුරා නිදහස් වන මාවතයයි. එනම් අවිජ්ජායත්වෙව අසෙසවිරාග නිරොධා සංඛාරනිරොධො, සංඛාරනිරොධා විඤ්ඤාණ නිරොධො.... ආදි වශයෙන් දැක්වෙන සසර නැවැත්මයි. දුකින් නිදහස්වීමේ වැඩපිළිවෙළයි. මෙලෙස පටිච්ච සමුප්පාදයේ ඇතිවීම හා නැතිවීම පැහැදිලි කෙරෙන මූලික න්‍යාය ඉදප්පච්චතාව හෙවත් ආර්ය න්‍යාය වශයෙන් දක්වා ඇත. එනම්

*'ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්මිං අසති ඉදං න හොති.'*
*'ඉමස්ස උප්පාද ඉදං උප්පජ්ජති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති.'*

යන විග්‍රහයයි.

පටිච්ච සමුප්පාදයේ පදනම වූ මෙම විග්‍රහය සම්බුද්ධ දේශනාව තුළ විවිධ ආකාරයෙන් ඒ ඒ ශ්‍රාවකයන්ගේ බුද්ධි මට්ටම හා අවස්ථාවෝචිත ව ඉදිරිපත් කර තිබෙනු දක්නට ලැබේ. බුදුරදුන් අවබෝධ කළ මෙම යථාර්ථය පිළිබඳ විශ්වාසය ඇති කර ගැනීම ශ්‍රද්ධාවේ මූලික ලක්ෂණයකි.

ශ්‍රද්ධාව හෙවත් ප්‍රසාදය විශ්වාසය හටගන්නා ස්ථාන කිහිපයකි. ඒ අතර **බුද්ධ, ධම්ම, සංඝ, සික්ඛා, පටිච්චසමුප්පාද** යන කරුණු ප්‍රධාන වේ. බුද්ධ යනු මෙම ධර්මය අනාවරණය කළ උත්තමයන් වහන්සේයි. ධම්ම යන බුද්ධදේශිත අනුශාසනයයි. සංඝ යනු එම දහම් මග සිය ජීවිතය කර ගත් ආර්ය උත්තමයන් ය. සික්ඛා යනු සීල, සමාධි, පඤ්ඤා යනුවෙන් දැක්වෙන අධිසීල, අධිචිත්ත, අධිපඤ්ඤා යන ත්‍රිවිධ ශික්ෂාවයි. පටිච්චසමුප්පාද යනු දුකෙහි පැවැත්ම හා නැවැත්ම පිළිබඳ ආර්ය න්‍යායයි. මෙම අංග පිළිබඳ අවබෝධාත්මක ප්‍රසාදය පැහැදීම ශ්‍රද්ධාවයි. එය විචිකිච්ඡාවට හෙවත් සැකයට ප්‍රතිපක්ෂ ධර්මයකි. ධර්මමාර්ගයෙහි පෙරට යාමට අත්‍යවශ්‍ය සාධකයකි. අප සිදු කරන සෑම කුසලයක් සමඟ ම මෙය එකට ගමන් කරන කුසල චෛතසිකයකි. සද්ධා, සති, හිරි, ඔත්තප්ප යන යන චෛතසික හතර කුසලය සමඟ අත්වැල් බැඳ ගත් සිතිවිලි ය. සද්ධා මූලිකා සබ්බේපි කුසලා ධම්මා යනුවෙන් දැක්වෙන්නේ සියලු කුසලයන්ට ශ්‍රද්ධාව මූලික වන බව දක්වා ඇත්තේ එබැවිනි. ඊට අනුරූප පරිදි විතක්ක, විචාර, අධිමොක්ඛ, විරිය, පීති, ඡන්ද යන ප්‍රකීර්ණ චෛතසික ද උචිත පරිදි ක්‍රියාත්මක වේ.

ශ්‍රද්ධාවෙහි ප්‍රධාන ලක්ෂණ දෙකක් පවතී. එනම් සම්පසාදන ලක්ඛණ හා සද්දහන ලක්ෂණයි. සම්පසාදන ලක්ඛණ යනු සක්විති රජකු සතු උදක ප්‍රසාද මාණික්‍යයක් කැලඹුණ දියට දැමූ කල ජලය ප්‍රසන්න වන්නාක් මෙන් ශ්‍රද්ධා සිතිවිල්ල සිතෙහි පවත්නා විට සිතෙහි පවත්නා සෙසු අකුසල චෛතසිකවල සංසිඳීම සිදු වේ. සද්දහන ලක්ඛණ යනු අදහන ස්වභාවයයි. සිය ප්‍රත්‍යක්ෂයෙන් යමක් සපුරා ප්‍රත්‍යක්ෂ කර ගන්නා තුරු තමා ඇසූ දේ පිළිබඳ විශ්වාසයක් පැවැතිය යුතු ය. එය හුදෙක් අන්ධ භක්තියක්, අවිචාරාත්මක ඇදහීමක් නොව කරුණු දැන ඇතිවන අවබෝධාත්මක විශ්වාසයකි. දහමින් ඉදිරියට යාමට මෙය අත්‍යවශ්‍ය ප්‍රබල සාධකයකි. එසේ නොවුණ හොත් අප හැම දේම සැක කිරීමට ගොස් කිසිවක් අනුගමනය කිරීමට උත්සුක නොවනු ඇත. මෙම ඇදහීමේ ලක්ෂණය ප්‍රත්‍යක්ෂයෙන් නිමාවට පත්වන අතර සම්පසාදන ලක්ෂණය තවදුරටත් පවතිනු ඇත.

ශ්‍රද්ධාවේ ප්‍රභේද දැක්වීමේ දී මූලික අංග දෙකක් දක්වා තිබේ. එනම් අමූලිකා සද්ධා හා ආකාරවතී සද්ධා වශයෙනි. මෙහි ලා අමූලිකා සද්ධා යනු යමක් ගැන පැහැදිලි අවබෝධයක් නොමැති ව හටගන්නා ශක්තිමත් නොවූ පැහැදීමයි. එය ශක්තිමත් මුදුන් මුලක් නැති ගහකි මෙනි. එය ඕනෑම වෙලාවට නැති වීමට හෝ වෙනත් ආකාරයකට පෙරළීමට අවකාශ පවතී. ආකාරවතී සද්ධා යනු යමක් පිළිබඳව කරුණු දැන ඇති වන ප්‍රසාදයයි. එය ශක්තිමත් වූවකි. එය බුද්ධ, ධම්ම, සංඝ, සික්ඛා, පටිච්චසමුප්පාද යන අංග පිළිබඳ අවෙච්චප්පසාදනය නම් වූ අචල සද්ධාව දක්වා ගමන් කරන්නකි.

සප්ත ආර්ය ධනය විස්තර කිරීමේ දී ශ්‍රද්ධාව ධනයක් වශයෙන් දක්වා තිබේ. ධනයක ලක්ෂණය නම් එය සිහිකිරීම් මාත්‍රයෙන් පවා සිතට සැනසීමක් ලැබීමයි. තමා සරණ ගිය තෙරුවන හා ශික්ෂාව පිළිබඳ සිහිකිරීමෙන් පවා හිතට මහත් සැනසීමක් සතුටක් සහනයක් ලැබීමයි. ආලවක සූත්‍රයෙහි දක්වෙන පරිදි යමෙකුට මෙලොව ඇති ඉහළ ම ධනය (සද්ධී'ධ වित්තං පුරිසස්ස සෙට්ඨං) ශ්‍රද්ධාව යනුවෙන් දක්වා තිබේ. මෙය සත්තිස් බෝධිපාක්ෂික ධර්මවල දක්වෙන බල ධර්ම අතර බලයක් වශයෙන් ද ඉන්ද්‍රිය ධර්ම අතර ඉන්ද්‍රිය ධර්මයක් වශයෙන් ද දක්වා තිබේ. අවිජ්ජා සූත්‍රයෙහි නිවන් මග දක්වෙන කරුණු දහය අතුරෙහි කල්‍යාණ මිත්‍රත්වයෙන් සද්ධර්මශ්‍රවණයත් සමඟ ලැබෙන අංගයක් වශයෙන් ශ්‍රද්ධාව දක්වා තිබේ.

මෙම ශ්‍රද්ධාව සංසාර ඕඝතර තරණය කිරීමට හේතුවන ප්‍රධාන සාධකය වශයෙන් ද දක්වා තිබේ. කාම, භව, දිට්ඨි, අවිජ්ජා යන සතර ඕඝ තරණයට ශ්‍රද්ධාව පහුරක් මෙන් උපකාරවත් වේ. ධර්මය විමසීමේ දී පෙනී යන කරුණක් නම් ඇතැම් තැනෙක 'සද්ධා ජාතො උපසංකමති....' ආදී වශයෙන් ශ්‍රද්ධාවේ සිට ආධ්‍යාත්මික ගමන් මග ආරම්භ කරන ලෙසක් දක්වා තිබෙන අතර ඇතැමේ තැනෙක කල්‍යාණමිත්‍ර ආශ්‍රය, සද්ධර්මශ්‍රවණයෙන් අනතුරුව ලැබෙන අංගයක් වශයෙන් ද දක්වා තිබේ. මෙහි වැදගත් ලක්ෂණය නම් ශ්‍රද්ධාව යන ගුණාංගය පෘථග්ජන භූමියේ පටන් අර්හත්වය දක්වා ම වර්ධනය වන ගුණාංගයක් වශයෙන් දක ගත හැකි ය.

### සැදැහැවත් තැනැත්තාගේ ලක්ෂණ :-

සැදැහැවතකු බාහිරට ප්‍රකට වන ප්‍රධාන ගුණාංග තුනක් දක්වා තිබේ.

*'දස්සනකාමො සීලවතං සද්ධම්මං සොතුමිච්ඡති,*
*විනෙය්‍ය මච්ඡෙරමලං ස වෙ සද්ධො'ති වුච්චති.'*

යනුවෙන් දක්වෙන පරිදි සිල්වතුන් දකීමට, ධර්මය ශ්‍රවණය කිරීමට හා මසුරු මල දුරු කිරීමට ඇති කැමැත්ත සැදැහැවතකු තුළ අනවරතයෙන් දක ගත හැකි ය. ඔහු නිරතුරුව තුනුරුවන ඇසුරු කරමින් තම සන්තානයෙහි පවත්නා ලෝභාදී අකුසල විතර්ක දුරු කිරීමට අනවරතන උත්සාහයක නිරත වන අයුරු පෙනී යයි. එහි ප්‍රතිඵල වශයෙන් දිනෙන් දින තමා තුළ පවත්නා රාගාදිය දුරු කරමින් ආධ්‍යාත්මික සතුට වර්ධනය කර ගනිමින් ඉදිරියට ගමන් කරයි.

සැදැහැති තැනැත්තා දන් දෙන විටත් (*සද්ධාය දනං දෙති*), සිල් රකින විටත්, සමථ විපස්සනා වශයෙන් භාවනා වඩන විටත් වෙනත් යහපත් දෙයක් කරන විටත් ඒ සියල්ල ම ශ්‍රද්ධාව මත පිහිටා සිදු කිරීම විශේෂ ලක්ෂණයකි. ශ්‍රද්ධාව ඇති කුලපුත්‍රයා බොහෝ පින්දහම් සිදු කරන බව සඳහන් වේ (*සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති*).

### ශ්‍රද්ධාවේ අනුපූර්ව ගමන්මග :-

චංකී හා කීටාගිරි යන සූත්‍රයන්හි බුදුදහමේ අනුපූර්ව ප්‍රතිපදාව විග්‍රහ කරමින් ශ්‍රද්ධාවේ පටන් ක්‍රමයෙන් ධර්මාවබෝධය කරා යන ගමන් මග විස්තර කොට තිබේ.

*'කතඤ්ච භික්ඛවෙ අනුපුබ්බසික්ඛා, අනුපුබ්බකිරියා, අනුපුබ්බපටිපදා අඤ්ඤාරාධනා හොති. ඉධ භික්ඛවෙ සද්ධා ජාතො උපසඞ්කමති. උපසඞ්කමන්තො පයිරුපාසති. පයිරුපාසන්තො සොතං ඔදහති. ඔහිතසොතො ධම්මං සුණාති. සුත්වා ධම්මං ධාරෙති. ධතානං ධම්මානං අත්ථං උපපරික්ඛති. අත්ථං උපපරික්ඛතො ධම්මා නිජ්ඣානං ඛමන්ති. ධම්මනිජ්ඣානක්ඛන්තියා සති ඡන්දො ජායති. ඡන්දජාතො උස්සහති. උස්සහිත්වා තුලෙති. තුලයිත්වා පදහති. පහිතත්තො සමානො කායෙනචෙව පරමං සච්චං සච්ඡිකරොති. පඤ්ඤාය ච නං පටිවිජ්ඣ පස්සති'* (කීටාගිරි සුත්ත, මනි.2, 248 පිට) / (චංකී සුත්ත, මනි.2, 660 පිට).

ශ්‍රද්ධාව ඇති විට සත්පුරුෂ ඇසුර වෙත එළඹෙයි. එළඹියේ ඇසුරු කරයි. ඇසුරු කරනුයේ දෙසවන යොමු කරයි. දෙසවන් යොමු කරනුයේ ධර්මය අසයි. ධර්මය අසා දරා ගනියි. දරාගත් ධර්මයේ අර්ථය පරීක්ෂා කරයි. අර්ථය පරීක්ෂා කරනුයේ ධර්මයෝ අවබෝධ වෙති. ධර්මය වැටහුණ කල්හි එහි නියැළීමට කැමැත්ත හටගනී. කැමැත්ත ඇති කල්හි උත්සාහය හටගනී. උත්සාහය ඇති වී අනිත්‍යාදි වශයෙන් තුලනය කරයි. තුලනය කොට ප්‍රධන් වීර්යය වඩයි. ප්‍රධන් වීර්ය වඩනුයේ නාමකයින් ද පරම සත්‍යය සාක්ෂාත් කරයි. එයි ප්‍රඥාවෙන් ද පිරිසිඳ දකියි.

**ශ්‍රද්ධාවට වඩා ඥානය උතුම් බව :-**

දිනක් නිගණ්ඨ නාතපුත්ත වෙත පැමිණි චිත්ත ගෘහපතිතුමා ශ්‍රද්ධාව පිළිබඳ සංවාදයක යෙදුණේ ය. එහි දී නිගණ්ඨ නාතපුත්ත, චිත්ත ගෘහපතිතුමා වෙතින් විමසා සිටියේ බුදුරදුන් දේශනා කරන අවිතක්ක අවිචාර වූ සමාධියක් ගැන තමා විශ්වාස කරනවා ද යන්නයි. එනම් ද්විතීය ධ්‍යානය විශ්වාසයෙන් අදහනවා ද යන්නයි. එහි දී චිත්ත ගෘහපති සඳහන් කළේ තමා ශ්‍රද්ධා මාත්‍රයෙන් පමණක් එබඳු මානසික තත්ත්වයක් ගැන විශ්වාස නොකරන බවයි. මෙහි දී නිගණ්ඨනාතපුත්ත චිත්ත ගෘහපති පිළිබඳ ප්‍රසාදයට පත් විය. ඊට හේතුව බුදුරදුන් පවසනා දේ පිළිබඳ ඔහු විශ්වාස නොකරන බව පැවැසූ බැවිනි. තවදුරටත් මේ පිළිබඳ සංවාදයක යෙදෙන චිත්ත ගෘහපති නිගණ්ඨ නාතපුත්තගෙන් විමසා සිටින්නේ ස්වාමීනි, වඩාත් වැදගත් වන්නේ ඥානය ද ශ්‍රද්ධාව ද යන්නයි. ‘තං කිම්මඤ්ඤසි භන්තෙ, කතමං නු ඛො පණීතතරං ඤාණං වා සද්ධා වාති.’ ඊට පිළිතුරු වශයෙන් නිගණ්ඨ නාතපුත්ත පවසන්නේ ඥානය හා ශ්‍රද්ධාව අතර ඥානය වඩාත් උතුම් බවයි. ‘සද්ධාය ඛො ගහපති ඤාණං යෙව පණීතතරං’. මෙහි දී චිත්ත ගෘහපති විශේෂයෙන් ප්‍රකාශ කරන්නේ මෙම අවිතක්ක අවිචාර වූ ධ්‍යානය හුදෙක් විශ්වාසයෙන් නොව තමා ප්‍රත්‍යක්ෂයෙන් ම අත්විඳින බවයි. දෙවන ධ්‍යානය පමණක් නොව තෘතීය, චතුර්ථධ්‍යානය පවා තමා ප්‍රත්‍යක්ෂයෙන් ම අත්විඳින කල තමා කෙසේ නම් වෙනත් බාහිර ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණයකු මත ශ්‍රද්ධාවෙන් කටයුතු කළ යුතු දැයි චිත්ත ගෘහපති මෙහි දී නිගණ්ඨ නාතපුත්ත වෙතින් ප්‍රශ්න කරයි (නිගණ්ඨසුත්ත, සං.නි.4, චිත්ත සංයුත්ත, 544 පිට). මාර්ගඵල හා නිවන පිළිබඳව ද මෙම ක්‍රමයෙන් ම අපට තේරුම් ගත හැකි ය. ඒ අනුව අස්සද්ධො අකතඤ්ඤූ යනුවෙන් රහතන් වහන්සේ තම අද්දැකීම සඳහන් කරන්නේ ශ්‍රද්ධාව ඉක්මවූ කළ යුත්ත ඉක්ම වූ (අකත නම් වූ නිවන දත්) තැනැත්තකු වශයෙනි.

භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ පරිදි ධර්ම මාර්ගය පිළිබඳ මනා වූ ශ්‍රද්ධාවක් ඇති කල්හි ධර්ම මාර්ගයේ ඉදිරියට යාමට දැඩි ජවයක් හටගනී. එය වීර්ය ප්‍රබල වීමටත් සති, සමාධි, පඤ්ඤා යන සෙසු බලධර්ම, ඉන්ද්‍රිය ධර්ම ක්‍රමයෙන් වර්ධනය වේ. මෙලෙස ධර්ම මාර්ගයෙහි ඉදිරියට යන විට ධර්මයෙහි පවත්නා සාංදෘෂ්ටික අකාලික යන ගුණ ප්‍රකට වන අතර ආධ්‍යාත්මික සංතෘප්තිය දියුණු වෙමින් තව තවත් ඉදිරියට යාමට උනන්දුව හටගනී. නිර්වාණාවබෝධය දක්වා ම මෙම ශ්‍රද්ධාව ශ්‍රාවකයාට මහත් උපකාරයක් වේ.

# *Saddhā –*

# Confidence or Faith in What the Buddha Realized

The main purpose of Buddhism is purification of mind. Our real happiness completely depends on how far we have purified our mind from negative thoughts such as greed, anger and delusion, and how much virtue, tranquility and wisdom we have developed. Here, the confidence

(***Saddhā***) on the Triple Gem, i.e., the Buddha, His teaching (the Dhamma) and His noble disciples (the Sangha) is the major point that determines as to how skillful we are in the pursuit of Enlightenment. *Saddhā* should be accompanied from the beginning to the very end of the path of purification. When we practice Buddhist doctrines, our confidence gradually increases because we see the results throughout our lives. Simultaneously, when confidence in the Buddha's message grows up, the energy also upturns since our inner peace grows up.

If someone hopes to go on the path of purification with practicing Buddha's message, he or she should develop the quality of faith, belief or confidence gradually. Confidence is the first step in every religion. The difference of Buddhism is it never says **'come and believe'**, it says **'come and see'.** The confidence increases according to our knowledge and understanding in Buddhism. That is why the Buddha said, **one who sees the Dhamma sees me; one who sees me sees the Dhamma (*Yo dhammam passati so mam passati, yo mam passati so dhammam passati*).**

At the very beginning of the path of liberation, confidence can arise by seeing or hearing something in Buddhist tradition. Further, it increases by listening to the Buddha's real message (which relates to understand the Karmic law and the Dependent Origination) and associating with the Buddha's noble disciples. Depending on our knowledge about our mind, body and the word according to the Buddha's message, we can go forward with confidence. Generally, we can explain confidence as the faith in the Triple Gem i.e., Buddha, Dhamma and Sangha. More exposure to the noble qualities of The Supreme Buddha, His teachings (***Dhamma***) and His noble disciples (***Sangha***) along with motivation and positive attitude can be called confidence in Buddhism. Especially, the confidence of Buddha's Enlightenment is the key to cultivate all the qualities of Enlightenment.

The disciple of the Noble One is endowed with verified faith, confidence and conviction in the Awakened Buddha as follows; Worthy (*Araham*), honorable and perfectly enlightened (*Sammā Sambuddho*) is the Buddha! Fully consummate in knowledge and behavior (*Vijjacaranasampanno*), totally transcended, expert in all the phases and dimensions (*Sugato*), knower of all worlds (*Lokavidu*), unsurpassable trainer of those who can be tamed (*Anuttaro purisadammasārathi*), both teacher and guide of deities and humans (*Sattha Devamanussanam*), awakened and enlightened (*Buddho*) blessed and exalted (*Bhagavā*), is the Buddha. With the understanding and confidence of the Buddha's Enlightenment, the disciple is endowed with verified faith, confidence and conviction in the Dhamma as follows; Perfectly formulated is this Buddha-Dhamma (*Svākkhato*), visible right here and now (*Sanditthiko*), immediately effective, timeless (*Akāliko*), inviting each and every one to come and see for themselves (*Ehipassiko*), inspect, examine and verify leading each and every one through progress towards complete perfection (*Opanaiko*), directly observable, experienceable and realizable by each intelligence (*paccattam veditabbo vinnuhi*). With the confidence on the Buddha and the Dhamma, the disciple becomes clever with verified faith, confidence and conviction in the Noble Sangha as follows; perfectly trained is this noble Sangha community of the Buddha's Noble disciples:

Trained in the right way, the true way, the good way, the direct way! Therefore these 8 kinds of individuals, these four noble pairs, deserve both gifts, grants, sacrifice, offerings, hospitality and reverential salutation with joined palms, since this noble Sangha community of the Buddha, is an unsurpassable and forever an unsurpassed field of merit for this world, to honor, respect, support, offer and protect.

This confidence is not a blind faith. It depends on the understanding of Buddha's message. Buddhism explains confidence as a great wealth (***saddhā dhanam***). If we are rich in material wealth, we are rich in happiness. However, that happiness can be changed instantly because it is material, but the wealth (treasure) of confidence is not like that. It doesn't change when material richness changes. Saddhā will not die along with the physical body. If we have strong confidence on the Buddha, his teachings and his noble disciples, our mind always is full with satisfactoriness and happiness. Then negative thoughts such as anger, greed, ignorance and jealousy will have no place in our mind. And positive thoughts such as loving kindness, compassion, generosity and wisdom will also be gradually developed in our mind.

The Buddha says the understanding of suffering causes to increase the confidence. If someone has the knowledge about arising of suffering as per the Buddhist perspective, his confidence will gradually increase. At the very beginning, he understands that when we do some unwholesome deeds with wicked mind in our life, we will have the bad results (disadvantages) not only here after but in this life itself as well. So too we will be the good results of good deeds. If a person has this knowledge, that person doesn't like to suffer anymore, as he is intelligent. That is why he motivates himself to get rid of evils and cultivate good in his life, as soon as he can. This is the nature of the confidence in the Dhamma. Therefore, Buddhism says that all good qualities which are wholesome, depend on confidence (*Saddhā mulika sabbepi kusalā dhammā*).

If we believe in Buddha's message, we believe in destiny or ***karmic law***.
Then we don't do any evil (unwholesome deeds) and cultivate good (wholesome deeds).
Furthermore, we try to get rid of suffering and try to find real happiness.

Buddhism continually emphasizes the importance of confidence on the Triple Gem (*saddha*) because it is an essential quality that we develop.

**Saddhā is the seed (*saddhā beejam*), the initiator, and thus the source at the beginning.**

**Saddhā is the hand that takes up all the advantageous mental states.**

**Saddhā is the wealth (*saddhā dhanam*) above all, since it brings real and lasting happiness.**

**Saddhā is the jump (*saddhāya tarati ogham*), since it enables beings to cross the flood of pain.**

**Saddhā is the purifier, since it cleans pollutions of the mind.**

*Saddha* is one of the main spiritual faculties. When we practice confidence towards the Triple Gem, other spiritual qualities will also develop within us. As much as we have confidence in the Triple Gem, it is able to develop four other spiritual qualities i.e., energy (*Viriya*), mindfulness or awareness (*Sati*), concentration or tranquility (*Samādhi*) and wisdom (*Panna*) for the success of our life.

Furthermore, if we have knowledge about suffering as the Buddha mentioned, our faith in Buddha improves. Especially, when we see the arising and ceasing of the five aggregates, we can see the way to get rid of suffering. The nature of practicing Buddha's message is to have directly visible results.

To cultivate *saddhā*we have to acquire four other qualities. They are;

1. Associating good friends (***Sappurisa sansevo*** **- සප්පුරිස සංසේවෝ )**

2. Listening to the Buddha's message to cease suffering **(*Saddhamma savanam* – සද්ධම්මසවණං)**

3. Wise reflection **(*Yoniso manasikāro* – යෝනිසෝ මනසිකාරෝ)**

4. Practicing accordingly **(*Dhammānudhamma patipatti* – ධම්මානුධම්ම පටිපත්ති)**

From the beginning to the end of the path of purification we have to develop these qualities again and again every moment with alertness and understanding. The more we practice the more result we can see in this life itself. Developing mindfulness with wisdom while seeing the worldly reality such as impermanence, unsatisfactoriness and egolessness is the ultimate goal of practice. Final result of practicing them is the liberation from all sufferings and living with the highest contentment and loving kindness.

ඔබ සැමට තෙරුවන් සරණයි !

**'සඟසරණ නැණකිරණ'** ධර්ම සාකච්ඡා 5

ලොස් ඇන්ජලීස් බෞද්ධ විහාරය - කොවීනා

Mindfulness Meditation Center - 05.02.2024